**YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION**

We provide a very professional, personalised and affordable service to all your Migration related needs…

WE OFFER VERY SPECIAL RATES FOR PROVISIONAL VISA HOLDERS & STUDENTS

We enrol international students to leading Australian educational institutions as well. Our services are entirely FREE for our prospective students.

DMS
DESTINY MIGRATION SOLUTIONS
YOUR TRUSTED PARTNER IN AUSTRALIAN MIGRATION

AMILA WEERASINGHE
LL.B. Grad Cert Mig Law MMIA
Registered Migration Agent
MARN 1067683

**DESTINY MIGRATION SOLUTIONS**
21 McMaster Court Pakenham Victoria
T / F 03 5941 4042
Call 04 3009 0385
info@destinymigrations.com
www.destinymigrations.com

MIA
Member of Migration Institute of Australia

**Sri Lankan Office**
Destiny Migration Solutions PVT Ltd
28 Jayanthi Mawatha Pamunuwa Road Maharagama
T / F 2841387 M 071 6161888

## MATHEMATICS TUTORING

Maths Methods(CAS) 3&4

Specialist Mathematics

Maths Methods(CAS) 1&2

General Maths Advance

Mathematics Year 7-10

*by* **Madira Ginnige**
Experienced Current Secondary School Mathematics Teacher

**Attending my small group tuition class will**
- Increase confidence, Grades, motivation and self-esteem.
- Gain the ability to manage study time efficiently.
- Ability to manage time efficiently during exam periods.
- Provide opportunity to work through highly relevant, current Trial Sac & Examination questions.

To book/register, contact
**03-98071577 or SMS 0432972667**
or send an e-mail to:
madiraginige1@yahoo.com

*Individual lessons available on request

**Venue: 1/17 Mummery Street, Mount Waverley 3149**

# නිරුවත් රූමතියෝ



ඉංගිරිසියෙන් ටීනේජ් යැයි පොදුවේ හැඳින්වෙන ගැටවර විය යනු අප ළමා වියෙන් තරුණ වැඩිහිටි වියට යන ගමනේ දී ගතකරන එක්තරා ආකාරයක සංක්‍රාන්ති සමයක් ලෙසින් හැඳින්විය හැකිය.

ගැටවර වියේ මුල් අඩවියේ දී අපේ හැසිරීම් ළමා කාලයට වඩාත් සමීපවද, ගැටවර වියේ අවසාන අඩවියේ දී අපේ හැසිරීම් තරුණ වැඩිහිටි කාලයට වඩාත් සමීපවද ක්‍රියාත්මක වෙන බව අපි අත්දැකීමෙන් ම දනිමු.
උසස් පෙළ හදාරන කාලයේදී මේ ගැටවර හෝ-මෝන උතුරා යන්නට පටන් ගත් විට, සිරුරේ ඇතිවන වෙනස්කම් සමගම සිතේ ද අමුතු සිතුවිලි හට ගන්නට පටන් ගනී. සාමාන්‍ය පෙළ සෞඛ්‍ය පාඩමේදී කියා දුන් පොඩි පොඩි ලිංගික කරුණු වලට අමතරව වෙනත් ක්‍රමවත් අධ්‍යාපනික පැහැදිලි කිරීමක් අපට කිසි විටක පාසලෙන් හෝ නිවසෙන් හෝ නොලැබුණු නිසා ඒ බෝට්ටුවේම සිටින සම වයසේ මිතුරන්ගෙන් ලැබෙන අනිසි අදහස් සහ උපදෙස් මත අපේ සිත් තරමක් දුරට හෝ හැඩ ගැසීම වැලැක්විය නොහැකිය. අප හැදුණු වැඩුණු සමාජය මේ සම්බන්ධයෙන් අපේක්ෂා කලේ ද එය විය හැකිය.

කෙල්ලන් පිළිබඳ ආදර සිතුවිලි මෙන්ම ඍංගාරාත්මක සහ රාගාධික සිතුවලි ද අපේ සිත්වලට මේ ගැටවරවියේ අග කාලයේදී

*කුඩා කල සිටම පුවත්පත්, පොත් කියවීමට ඇබ්බැහි වී සිටි මා, කොතැනක වුවද පොත් අල්මාරියක් හෝ පරණ පත්තර ගොන්නක් තිබෙනු දුටුව හොත් එතැනට ඇදී යන්නේ වන "මලකට ඇදෙන බඹරෙකු" ලෙසිනි.*

කෙමෙන් කෙමෙන් කාන්දු වේ. -වැඩිහිටියන්ට පමණයි" යනුවෙන් වර්ගීකරණය කරන ලද සිනමාපටවල අඩංගු විවිධ දේ ගැන පන්ති කාමර වල නිරතුරු කතා බහ කෙරේ. එද අප " වැඩිහිටියන්ට පමණයි" ලේබලය ලද චිත්‍රපටයක ප්‍රචාරක පුවරුවක ඇඳ තිබූ චිත්‍රයක් බලා වින්දනයක් ලැබුවෙමු. අපේ පන්තියේ සිටි උස්-මහත් සිරුරෙන් වැඩී සිටි සමහර ළමෝ කෙසේ හෝ චිත්‍රපට ශාලාවලට රිංගා මේ සිනමා සිත්තම් සමහරක් නරඹා තිබුණාහ. මේ චිත්‍රපට වනාහී නීතියෙන් තහනම් අශ්ලීල නිල් වර්ගයේ ඒවා නොව, නිරුවත් දර්ශන නිසා පෙරකී " වැඩිහිටියන්ට පමණයි" ලේබලය ලද ඒවා විය.

තාක්‍ෂණයේ දියුණුවත් සමගම අද වන විට මේ සම්බන්ධ තත්වය එද වසර තිස් ගණනකට ඉහත කාලයට වඩා වඩා අති මහත් දියුණු තත්වයට පත් වී අන්තර්ජාලය, ඩී.වී.ඩී, ජංගම දුරකතන යනාදිය හරහා තහනම් අශ්ලීල දේ දක්වා විහිදී යමින් ඇති බව ද මෙහිදී කිව යුතුය.

එවැනි චිත්‍රපට වලට අමතරව නිරුවත් රූමතියන් ගේ ඡායාරූප අඩංගු පොත්-පත් තිබෙන බව අප අසා තිබුණෙමු. නමුත් එවැන්නක් අහම්බයකින් මෙන් මා නෙත ගැටුනේ මිතුරන් ගේ මාර්ගයකින් නොව මා හොඳින් දන්නා හඳුණන නිවසක පැරණි පුවත්පත් ගොඩක් අතර තිබී ය.

කුඩා කල සිටම පුවත්පත්, පොත් කියවීමට ඇබ්බැහි වී සිටි මා, කොතැනක වුවද පොත් අල්මාරියක් හෝ පරණ පත්තර ගොන්නක් තිබෙනු දුටුව හොත් එතැනට ඇදී යන්නේ වන "මලකට ඇදෙන බඹරෙකු" ලෙසිනි. මේ කියන දිනයේ දී මා එකී පරණ පත්තර ගොන්න අවුස්සන්නට ඇදී යාම විස්තර කිරීමට නම්, වඩාත් නිවරදි උපහැරණක් වන්නේ, "ගිනි සිළුවකට ඇදී යන පළගැටියෙක්" ලෙසින් යන්න හෝ එසේ නැතිනම්, "පැණි හැලියකට ඇදී යන ඇඹලයෙක්" ලෙසින් යන්න හෝ වඩාත් නිවරද බව අද මට අපරදෘෂ්ටියෙන් යුතුව පැවසිය හැකි ය.

එද මගේ හිත ඇදී ගිය පරණ පත්තර ගොන්න " දවස" ප්‍රකාශනයක් වූ "රසකතා" ද, "ලේක්හවුස්" ප්‍රකාශනයක් වූ "යොවුන් ජනතා" ද එසේ නොමැති නම්, "විජය" ප්‍රකාශනයක් වූ " තරුණයා" ද යන්න මට මතක නැත. එසේ වුවද, ඒ පත්තර ගොන්න අතරේ සැඟවී මුත් දිදුලමින් තිබී මා නෙත ගැටුණු මනරම් වර්ණයෙන් ඔප කඩදසියේ මුද්‍රිත සඟරාව නම් මගේ මතකයේ සද රැඳී ඇත.

මේ සඟරාවේ බැලූ විටම කැපී පෙනෙන වෙනස් කම් රාශියක් තිබුණි. එහි මුද්‍රණය කෙතරම් හොඳින් කර තිබුනේද යත්, මා එවැනි නිමාවකින් යුතු සඟරාවක් ඉන් පෙර දැක තිබුනේ නැත. සඟරාවේ නම අනිවාර්යයෙන්ම ඉංගිරිසි නොවිණි. එය ජර්මන් භාෂාව යැයි පසුව මට සිතුණි. පිට කවරයේ මුද්‍රිත ඡායාරූපයේ සිටි රූමතිය සිටියේ ද මා පෙර දැක නොතිබුණු අමුතුම ආකාරයේ විලාසයක් මවමිණි.
මම සඟරාවේ මුල් පිටු කිහිපය පෙරලූවෙමි. තේරුම් ගත නොහැකි භාෂාවකින් කතුවැකියක් වැනි යමක්, වෙළඳ දැන්වීම් වැනි පිටු කිහිපයක්